ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

සන්නිවේදන දෙපාර්තමේන්තුව
30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව
දුරකථන අංක: 2477424, 2477423, 2477311
ෆැක්ස්: 2346257, 2477739
ඊ-මේල්: dcommunications@cbsl.lk, communications@cbsl.lk
වෙබ් අඩවිය: www.cbsl.gov.lk


# පුවත්පත් නිවේදනය

| | |
|---|---|
| නිකුත් කළේ | සංඛ්‍යාන දෙපාර්තමේන්තුව |
| දිනය | 2013/02/28 |

## 2013 පෙබරවාරි මස උද්ධමනය

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් ගණනය කරනු ලබන කොළඹ පාරිභෝගිකයන්ගේ මිල දර්ශකය (කො.පා.මි.ද.) (2006/2007=100) මගින් මනිනු ලබන උද්ධමනය, 2013 පෙබරවාරි මාසයේ දී, ලක්ෂ්‍යමය පදනම මත පූර්ව මාසයේ වාර්තා කළ සියයට 9.8 මට්ටමෙහිම පැවතිණි. වාර්ෂික සාමාන්‍ය පදනම මත උද්ධමන අනුපාතිකය 2013 ජනවාරි මාසයේ පැවති සියයට 8.1 හි සිට 2013 පෙබරවාරි මාසයේ දී සියයට 8.6 දක්වා ඉහළ නැගිණි.

මේ අතර, මූලික උද්ධමනය ලක්ෂ්‍යමය සහ වාර්ෂික සාමාන්‍යය යන දෙයාකාරයේම පදනම් මත පිළිවෙළින්, 2013 ජනවාරි මාසයේ පැවති සියයට 7.3 සහ සියයට 6.1 හි සිට 2013 පෙබරවාරි මාසයේ දී පිළිවෙළින්, සියයට 7.4 සහ සියයට 6.3 දක්වා ඉහළ නැගිණි.




කො.පා.මි. දර්ශක අගය 2013 ජනවාරි මාසයේ දී පැවති 170.0 හි සිට 2013 පෙබරවාරි මාසයේ දී 170.7 දක්වා නිරපේක්ෂ වශයෙන් වැඩි වෙමින් පූර්ව මාසයට සාපේක්ෂව සියයට 0.4 කින් ඉහළ නැගිණි. ආහාර කාණ්ඩයේ මිල ගණන් සියයට 0.6 කින් වැඩි වීම දර්ශකයේ මෙම මාසික ඉහළ යාම කෙරෙහි ප්‍රධාන වශයෙන් දායක විය. සමහර එළවළු වර්ග, පළතුරු, කරවල, බිත්තර, අමු මිරිස් සහ පිළියෙළ කළ ආහාර වර්ගවල මිල ගණන් මෙම මාසය තුළ ඉහළ ගියේය. කෙසේ වුවද, සමහර එළවළු වර්ග, නැවුම් මත්ස්‍ය වර්ග, දෙහි, රතුළූණු සහ අර්තාපල් මිල ගණන්හි පහළ යාමක් වාර්තා විය. ආහාර නොවන කාණ්ඩයේ නිවාස, ජලය, විදුලිය, ගෑස් හා අනෙකුත් ඉන්ධන (සියයට 0.4 කින්); ගෘහ භාණ්ඩ, ගෘහ උපකරණ හා දෛනික ගෘහ නඩත්තු (සියයට 0.2 කින්); සෞඛ්‍යය (සියයට 0.2 කින්); සහ විවිධ භාණ්ඩ හා සේවා (සියයට 0.7 කින්) යන උප කාණ්ඩයන්හි මිල ගණන් ඉහළ නැගිණි. කෙසේ වුවද, රෙදිපිළි හා පාවහන් උප කාණ්ඩයේ මිල ගණන් 2013 පෙබරවාරි මාසයේ දී සියයට 0.4 ක පහළ යාමක් වාර්තා කළේය. මේ අතර, ප්‍රවාහන; සන්නිවේදන; විනෝදාත්මක හා සංස්කෘතික; සහ අධ්‍යාපන යන උප කාණ්ඩයන්හි මිල ගණන් මෙම මාසය තුළ නොවෙනස්ව පැවතිණි.